# තරුණ ගොවීන්ගේ අරමුණු



මානවිල ගමේ ඩී. කේ. ඩැනී තරුණ ගොවි මහතා

තරුණ ගොවි සමාජ ව්‍යාපාරයේ ඉතාම වැදගත් අංශය වන්නේ එම සංවිධානයට බැඳී ඇති සාමාජික සාමාජිකාවන්ගේ අරමුණු ය. එම අරමුණුවලින් අදහස් කරනුයේ තරුණ තරුණියන් ඔවුන්ගේ විවේක කාලවල ප්‍රයෝජනවත් ව්‍යාපාරයන් උදෙසා කාලය ගතකර වීමය. එසේ අරමුණුවලට ඇබ්බැහිවීමෙන් ප්‍රයෝජනවත් කාර්යයක යෙදී ඉන් වටිනා ලාභ පමණක් නොව වැදගත් අධ්‍යාපනයක්ද මෙම තරුණ තරුණියන්ට ලබාගත හැකිවේ. තරුණ පරපුරට අයත් වටිනා කාලය අපතේ ගත නොකර ඉන් ප්‍රයෝජන ගැනීමට මාර්ග යක්ද මෙයින් සැලසේ. කෘෂිකාර්මික අරමුණු ගැන තරුණ ගොවීන් පෙන්වන උනන්දුව දිනෙන් දින වැඩිවෙත්ම, දිවයිනේ ආහාර නිෂ්පාදනය තවත් තව උසස් කරගත හැකිය. කෘෂිකාර්මික අරමුණුවල යෙදී වටිනා ලාභ ප්‍රයෝජන හා අධ්‍යාපනයක්ද ලබන දකුණේ තරුණ ගොවි සාමාජිකයෙකුගේ අරමුණු ගැන විස්තරයක් මේ සමඟ සඳහන් වේ.

### වී ගොවිතැන් අරමුණක්

ගාලු දිස්ත්‍රික්කයේ, කඩවත් සතර අක්මී මන මානවිල ග්‍රාමයේ ඩී. කේ. ඩැනී තරුණ ගොවි මහතා මෑතක් වනතුරු මානවිල තරුණ ගොවි සමාජයේ ගරු ලේකම් වශයෙන් සමාජ යට මහඟු සේවයක් කළේය. ගොවි සමාජය ගැන විශෙෂ ලැදියාවක් දැක්වූ මෙම තරුණ යාට කෘෂිකාර්මික වැඩ පිළිබඳ අති දක්ෂ කමක් පෙන්වීමට හැකි වූයේ 1956-57 වර්ෂ යේදී ලබුදුව ගොවි පාසැලේ ශිෂ්‍යයෙක්ව සිටි හෙයිනි.

වී ගොවිතැන පිළිබඳ සමත්කමක් හා ආශා වක් දක්වන මෙම තරුණ ගොවි මහතාගේ කෘෂිකාර්මික අරමුණු එයට පමණක් සීමාවී නැත. ඔහු දැනටද අක්කරයක එළවළු ඉතා සාර්ථකව වගාකර මසකට රුපියල් 60ට අධික ශුද්ධ ලාභයක් ලබයි. ඒ හැර පක්ෂීන් 35ක ආර්. අයි. ආර්. සහ සුදු ලෙගෝන් ගෙන් සමන්විත කුකුළු පට්ටියක් මොහුට තිබේ. ඔහුට කුකුළු පට්ටියෙන් දිනකට බිත්තර 10ක් පමණ ලැබෙයි. දෙනුන් පස් දෙනකුගේ කිරි පට්ටියක්ද මොහුගේ අරමුණු මාලාවට එකතු වේ. ඩැනී මහතාගේ අරමුණු බැලීමට අප ගිය විට එම දෙනුන්ගෙන් දෙදෙනෙක් හැර සෙස්සෝ කිරි මුරය ඉක්මවූවන් බව දැන ගතිමු. ගව පාලනය පිළිබඳ සහතිකයක්ද මෙම තරුණ ගොවියා ලබා ඇති නිසා කිරි පට්ටියේ වැඩ ඉතා ක්‍රමානුකූලව ඉටු කිරීමට උපකාර වී තිබේ.

බටදූවේ ආහාර නිෂ්පාදන ඔවර්සියර් මහතා ගේ උපදෙස් ඇතිව මෙම තරුණයා ඔහුගේ අරමුණුවල යෙදෙන හෙයින් මෙවැනි විශිෂ්ඨ ප්‍රතිඵල ඔහුට ලබා ගැනීමට හැකිවී ඇත. එ මෙන්ම නොයෙකුත් දියුණු ගොවිතැන් ක්‍රම

ගැන වැඩි විස්තර දැන ගන්නේ පළාතේ ගොවිකම් ව්‍යාප්ති සේවයෙන් බව ඇනී මහතා අපට දැන්වීය.

තමාගේ ගොවිතැන් අරමුණු ගැන ඔහු විස්තර කළේ මෙසේය :—

"1954 වර්ෂයේදී මා පාසැල් ශිෂ්‍යයෙකුව සිටි අවදියේදී, ගාලු කඩවත් සතර අක්මීමන මානවිල ග්‍රාමයේ තරුණ තරුණියන් සමඟ එක්ව, පළාතේ ආහාර නිෂ්පාදන ඕවර්සියර් මහතාගේ සහාය ඇතිව තරුණ ගොවි සමාජයක් පිහිටුවීමි. එම අවුරුද්දේ යල් කන්නයේ මගේ පියා විසින් වගා කළ කුඹුරේ මමද වැඩ කර ගොවිතැනට ක්‍රමයෙන් පුහුණුවක් ලදිමි. මින් පසු දියුණු වී ගොවිතැන් ක්‍රම කෙරෙහිද ආශාවක් ඇතිවූ මා 1959-60 මාස් කන්නයේ දී කුඹුරු අක්කර $1\frac{1}{2}$ක පැළ ගොයම් පෝරු ගැවෙමි. එම ක්‍රමය පමණක් භාවිතා කර වී බුසල් 12ක වැඩි අස්වැන්නක් ලැබූ නිසා මා වඩාත් ඔදවැඩි සිත් වීමි. බුසල් 12 එතරම් වැඩි අස්වැන්නක් නොවූවත් ගාලු දිස්ත්‍රික්කයේ ගොවීන්ට නම් මෙහි සාර්ථකත්වය මනාව වැටහෙනවා නිසැකය. මෙහි වී ගොවිතැන එතරම් ගැටළු සහිතය.

මීළඟට මගේ සිත් යොමු වූයේ පේලි ක්‍රමයට පැළ සිටුවීම ගැනය. මානවිල සමාජයේ සාමාජික සාමාජිකාවන්ගේ උදව් උපකාරද ඇතිව, වර්ෂා ජලයෙන් වැඩ කරන නිසරු යායක පිහිටි මගේ කුඹුරු අක්කර $1\frac{1}{2}$ක 1960 යල් කන්නයට පේලියට පැළ සිටුවීම කළෙමි. මෙම කුඹුරෙන් මීට ප්‍රථම ලැබෙන වී බුසල් 28ක අස්වැන්න ඉක්මවා බුසල් 48 කරා යා හැකි වූයේ පැළ සිටුවීමත් සමඟ ඊට අදාල අනෙක් කාර්යයෝද යථා කාලයේ ඉටු කළ හෙයිනි.

කුඹුරෙන් කොටසක් පෙරළා, තවානක් පිළියෙල කර ගොවිකම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් එච් 501 බිත්තර වී බුසල් $\frac{3}{4}$ක් තවාන් කෙළෙමි. කුඹුරේ ඉතිරි ප්‍රමාණය පිළියෙල කරන විට අමුකොළ වර්ග යොදා පාගා හැරීමි. අඟල් 8ක් පමණ පරතරය ඇති පේලිවල අඟල් 3න් 3ට එක් තැනෙක පැළ තුන බැගින් සිටුවීම කළෙමි. පේලියට වල් නෙලන යන්ත්‍රයෙන් ප්‍රථම වාරයට වල් නෙලූ පසු සල්ෆේට් ඔෆ් ඇමෝනියා යකඩ බර $\frac{3}{4}$ක් කුඹුරට යෙදුවෙමි. මීට පසුද යම් වතාවක් යන්ත්‍රයෙන් වල් නෙලීම කළේ විනෝදමත් ක්‍රියාවක් ලෙසය. ගොයම් පේලි අතරේ ඇති වල් පැළෑටි පමණක් අතින් ගැලවීමට සිදු විය. නිතර කුඹුර බැලීමට යෑමට පුරුදු වූ මම විවේක කාලය ගත කළේ එහිය. ගොයම පිදීමට දින 30ට කලින් ඉතිරිව තුබූ සල්ෆේට් ඔෆ් ඇමෝනියා ප්‍රමාණය යෙදීමට අමතක

ඩැනි මහතාගේ එළවළු අරමුණ



මංසෙක්කා රෝගයක් පරීක්ෂා කරයි

නොකෙළෙමි. ගොයම කැපීම හැර අන් සියලුම වැඩ කළේ මානවිල තරුණ ගොවි සමාජයේ සාමාජික සාමාජිකාවන්ගේ ආධාර ඇතිවයි.

1960 යල් මෝසමේදී අක්කර ½ක පේලියට වී ඇට වැපිරීමක්ද කළෙමි. එම කුඹුරට ක්‍රමානුකූලව පෝර යොදා වල් නෙලීමේ උපකරණයද භාවිතා කිරීමෙන් වෙනදාට වඩා වී බුසල් 8ක වැඩි අස්වැන්නක් ලදිමි. ගොවිකම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි නවීන දියුණු ක්‍රම පළාත්වාසී සෑම ගොවි මහතෙකුම ක්‍රියාවේ යොදනවා නම්, වැඩි අස්වැන්නක් ලබාගත හැකි බව පවසන්නේ මගේ අත් දැකීමෙනි. නුදුරු අනාගතයේ තරුණ ගොවි පරපුර උනන්දුවී උසස් නවීන ගොවිතැන් ක්‍රම ක්‍රියාවේ යොදා දිවියන ස්වයම්පෝෂිත කිරීමට වඩාත් උත්සාහ දරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙමි."

1960-61 මාස් කන්නයට මෙම තරුණ ගොවි මහතා ඉතා විශිෂ්ඨතම වියක් වූ එච් 4 අක්කර ½ක් පේලියට පැළ සිටුවා පැසී, නැමී තිබෙනවා අපි දුටිමු. මොහු දියුණු ගොවිතැන් ක්‍රම වරක් පමණක් නොව කන්නයක් පාසා යෙදීමට දිරි දරන උද්‍යෝගිමත් තරුණයෙක් බව මෙහි සඳහන් කිරීමට අපට හැක්කේ එක් සිත්වය.

ඩැනී මහතාගේ එච්-4 වීගොවිපල